එච්. එම්. විජිත හේරත්, පා. ම.
எச். எம். விஜித ஹேரத், பா. உ.
H. M. Vijitha Herath, M. P.

විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍ය
வெளிநாட்டு அலுவல்கள், வெளிநாட்டு வேலைவாய்ப்பு மற்றும் சுற்றுலாத்துறை அமைச்சர்
Minister of Foreign Affairs, Foreign Employment and Tourism

## විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යතුමාගේ තෛපොංගල් පණිවිඩය

තෛපොංගල් උත්සවය සමරන අද දිනයේදී, හින්දු ප්‍රජාවට, විශේෂයෙන් ශ්‍රී ලංකාවේ සහ ලොව පුරා වෙසෙන දමිළ ජනතාවට මාගේ හෘදයාංගම සුබ පැතුම් පිරිනමමි.

තෛපොංගල්, ගැඹුරු ආවර්ජනාවන්, කෘතඥතාවන් සහ ප්‍රීතිමත් සැමරුම් සඳහා වෙන්වූ උත්සව කාලයක් ලෙස සැළකිය හැකිය. සශ්‍රික අස්වැන්න සහ ඒ සඳහා දායක වන අයගේ නොසැලෙන කැපවීමට අපි ගරු කරන විට, සොබාදහම, කෘෂිකර්මාන්තය සහ අපගේ ප්‍රජාවන්ගේ යහපැවැත්ම අතර ඇති ගැඹුරු සම්බන්ධතාවය අපට සිහිගන්වයි. ඉමහත් ගෞරවයෙන් හා උද්යෝගයෙන් සමරනු ලබන මෙම විචිත්‍රවත් උත්සවය, අස්වැන්න නෙළන සමයේ ආරම්භය පමණක් නොව, ඉදිරි වසර සඳහා නව ආරම්භයන් සහ අලුත් බලාපොරොත්තු මෙන්ම සූර්යයාගේ උතුරු දෙසට සිදුවන සංචාරයද සනිටුහන් කරයි.

සහස්‍රයකට අධික කාලයක් මුළුල්ලේ තෛපොංගල් උත්සවය, සම්ප්‍රදායේ, එකමුතුකමේ සහ පොදු වටිනාකම්වල ශක්තියට සාක්ෂියක් ලෙස පවතී. මෙම තෛපොංගල් උත්සව සමය ශ්‍රී ලංකාවට සහ ලෝකයට දීප්තිමත් අනාගතයක් ගොඩනැගීම සඳහා අපගේ සාමූහික කැපවීම පෙන්නුම් කිරීමට, එක්සත්ව කටයුතු කිරීමට සහ දයාව පැතිරවීමට අප සැමට උදාවන කාලයකි. අපගේ රටෙහි සමෘද්ධිය සහ එහි ජනතාවගේ සුභසාධනය සඳහා වූ පොදු වගකීමක හැඟීමක් ඇති කිරීම සඳහා සියලු බෙදීම් ඉක්මවා යමින් සාමය, සමගිය සහ සියලු දෙනා නියෝජනය වීම තෛපොංගල් උත්සවය මඟින් නිරූපණය කරයි.

මෙම තෛපොංගල් උත්සවය සෑම නිවසකටම සාමය, සමෘද්ධිය සහ ප්‍රීතිය ගෙන එනු ඇති අතර, බලාපොරොත්තුව, එකමුතුකම සහ ප්‍රගතියෙන් පිරුණු අනාගතයක් උදෙසා එක්ව කටයුතු කිරීමට අපට අවස්ථාව උදාකර දෙනු ඇත.

ශ්‍රී ලංකාවේ සහ ලොව පුරා සිටින දමිළ ප්‍රජාවට ආශිර්වාද ලත්, සමෘද්ධිමත් සහ අර්ථවත් තෛපොංගල් මංගල්‍යයක් ප්‍රාර්ථනා කරමි.

**විජිත හේරත්, පාර්ලිමේන්තු මන්ත්‍රී, විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍ය**

**2025 ජනවාරි 14**